**ණය මණ්ඩලය - 2013**
**------------------------**

ණය මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිළි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1973 අංක 33 දරන ණය මණ්ඩල (සංශෝධන) පනතින් සංශෝධිත ණය මණ්ඩල ආඥා පනතේ (311 අධිකාරය) 15 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම**
**--------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**
**----------------**

**2.1 මතය**
**--------**

මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ණය මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ආයෝජනය යටතේ හෙළිදරව් කර තිබූ රු.195,000 ක් වූ නිවාස හා දේපළ ණය 03 ක ණයකරුවන් විසින් ගෙවීම් පැහැර හැර තිබුණු අතර ඒවා අයකර ගැනීම සඳහා 1980 හා 1983 වර්ෂවලදී නඩු පවරා තිබුණ ද 2013 වර්ෂය දක්වා එම එම නඩු අවසන් වී නොතිබුණි. එසේම ණය සඳහා උකසට තැබූ දේපළවල හිමිකම් ඔප්පු, පිඹුරුපත්, ඇපකර, ණය ලේඛන, ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) වර්ෂ 30කට වැඩි කාලපරිච්ඡේදයක සිට අයනොවී සමුච්චිතව පැවති , නිවාස හා දේපළ ණය සඳහා ලැබිය යුතු රු.609,402 ක්වූ පොලී සමාලෝචිත වර්ෂයේ අවසන් දිනටත් අයකරගෙන නොතිබුණු අතර, මණ්ඩලය විසින් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම ණය ගිවිසුම්, ලෙජර, විස්තරාත්මක උප ලේඛන, ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවීය.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.18,650 ක අතිරික්තයක් වූ අතර , ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය ද රු.18,650 ක් විය. මෙය මණ්ඩලයට අයවිය යුතු 1980 හා 1983 වර්ෂවල සිට ඉදිරියට එන රු.195,000 ක් වූ නිවාස හා දේපළ ණය ශේෂයට අදාලව සමාලෝචිත වර්ෂයේ උපචිතකළ පොලී ආදායම බව අනාවරණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ණය මණ්ඩලය 1976 වර්ෂයේදී ඇවර කිරීම ආරම්භකර එහි අධීක්ෂණ කටයුතු 2001 අගෝස්තු 01 දින දක්වා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවට පවරා තිබුණි. අනතුරුව 2001 අගෝස්තු 02 දින සිට ඇවර කිරීම රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පවරා තිබේ. ඇවර කිරීමට තීරණයකර 1976 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 37 ක් ඉකුත්වී ඇතත් එම කටයුතු සම්පූර්ණකර නොතිබුණි. මේ පිළිබඳ විමසීමේදී ණය මණ්ඩලයට අදාල සියලු වත්කම් 2.2 (අ) හි සඳහන් නඩු නිමිති තුනට සීමා වන අතර එම තීරණ ලද විගස ආයතනය වසා දැමීමට කටයුතු කරන බව රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මා වෙත දන්වා තිබුණි.

(ආ) කොළඹ ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ හා යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පවතින නඩු තැන්පතු සඳහා ලාභාංශ හෝ පොලී තීරණය කිරීමක් සිදු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය අනුව 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණනය වෙත ඉදිරිපත් කළයුතු නමුත් එම මූල්‍ය ප්‍රකාශන 2014 ජූනි 17 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

(අ) සක්‍රීය නඩු තැන්පත් සඳහා අදාල පරිදි සාධාරණ ලාභාංශ හෝ පොලී තීරණය කිරීම.
(ආ) දේපළ ණය ශේෂ හා පොලී අයකර ගැනීම
(ඇ) ඇවර කිරිමේ කටයුතු